

## ඔබේ තොරතුරු කරා ලගාවීම

ඔබේ පෞද්ගලික සහ සෞඛ්‍ය තොරතුරු කරා ලගාවීමට ඔබට අයිතියක් ඇති අතර ඔබ මෙය කිරීමට කැමැත්තේ නම් ඔබ ගිය ජාන සායනයෙහි සම්බන්ධීකරු අමතන්න නැතහොත් යවන්න mail@genetichealthvic.net.au

**ජාන සෞඛ්‍යය** ඔබට රැකවරණය ලබාදුන් කාර්යමංඩලය තොරතුරු පිළිබඳ වැදගත් මුලාශ්‍රයක් නිසා ඔබට යම්කිසි ප්‍රශ්නයක් ඇතොත් කාර්යමංඩලයේ සාමාජිකයෙකුට කතා කිරීම අපි නිර්දේශ කරමු.

ඔබේ රැකවරණය පිළිබඳව ඔබ සැලකිළිමත්වන ඕනෑම පැමිණිල්ලක් පිළිබඳව විධිමත් ක්‍රියාපටිපාටියක් අපට ඇත. ඔබේ ජාන ලිපිගොනුවේ ඔබ එකඟ නොවන හෝ වැරදි කිසියම් තොරතුරක් ඇතොත් එවිට එය වෙනස්කරණ ලෙස ඉල්ලාසිටීමට ඔබට අයිතියක් ඇත. කෙසේවෙතත් පවුලේ අනෙක් සාමාජිකයන්ගේ තොරතුරු එහි ඇතුළත් වන නිසාත් ඔබේ වගේම ඔවුන්ගේ තොරතුරු ආරක්ෂාකිරීමට අප වගකියන නිසාත් මුළු ජාන ලිපිගොණුවම බැලීමට ඔබට අයිතියක් නොමැත.

## වැඩිදුර තොරතුරු

කරුණාකර අමතන්න 03 8341 6201
නැතහොත් බලන්න
www.genetichealthvic.net.au

**ලිඛිත පැමිණිළි ඉදිරිපත් කලයුතුයි**

ශායනික ගුණාත්මක සම්බන්ධීකරණ නිලධාරියා වෙත.
වික්ටෝරියානු ජාන සේවාව,
මර්ඩොක් ළමා පර්යෙෂණ ආයතනය.
(Murdoch Childrens Research Institute)
ෆෙලමින්ටන් පාර. පාක්විලා (Flemington Road Parkville)
වික්ටෝරියාව 3052 ඕස්ට්‍රේලියාව (Victoria 3052 Australia)



ඔබේ පෞද්ගලිකත්වය ජාන සෞඛ්‍යය ප්‍රතිපත්තිය

GENETICHEALTH | VCGSPATHOLOGY
Victorian Clinical Genetics Services

# ඔබේ පෞද්ගලිකත්වය



## ජාන සෞඛ්‍යය ප්‍රතිපත්තිය

Your Privacy
Genetic Health Policy
**Sinhala**

GENETICHEALTH | VCGSPATHOLOGY
Victorian Clinical Genetics Services



## ඔබේ පෞද්ගලිකත්වය ආරක්ෂාකිරීම

ජාන සෞඛ්‍ය සේවාව ට ඔබේ පෞද්ගලිකත්වය සහ සෞඛ්‍ය තොරතුරු ආරක්ෂාකිරීමට දැඩි ප්‍රතිපත්ති ඇත. ඔබේ තොරතුරු රෝහලේ වාර්තා වලින් වෙන්වූ ඔබේ රැකවරණය සම්බන්ධ සෞඛ්‍යය වෘත්තිකයනට පමණක් ලඟා විය හැකි ජාන ලිපිගොනුවක ආරක්ෂාසහිතව තැන්පත්කර ඇත.

ඔබේ ජාන පිලිබඳව තොරතුරු වල පවුලේ සාමාජිකයන් ගැන සඳහන්විය හැකිය. ඥාතීන්ට ඔවුන්ට බලපාන යම්කිසි කරුණක් ගැන තොරතුරු සෙවීමට අයිතියක් ඇත. පෞද්ගලිකත්වය හා විශ්වසනීයතාවය ආරක්ෂාකිරීමට තොරතුරු නිදහස්කිරීමට ප්‍රථම ඔබේ අවසර ලබාගනු ඇත.



## කුමන තොරතුරුද රැස්කරනුයේ

ඔබ හා ඔබගේ පසුබිම පිළිබඳව පරම්පරා ගණනාවක පවුලේ ඉතිහාසය ද ඇතුළත්ව තොරතුරු රැස්කිරීම අපට අවශ්‍යවේ. ඔබේ නම, ලිපිනය, ඔබේ ප්‍රාදේශීය වෛද්‍යවරයාගේ නම එමෙන්ම ඔබට රැකවරණය සැපයීමට දායක වූ වෙනත් වෛද්‍යවරුන් හෝ සෞඛ්‍ය වෘත්තිකයන් ගේ තොරතුරුද අපට අවශ්‍ය වේ.

ඔබේ පෞද්ගලික සෞඛ්‍ය තොරතුරු හැකිතාක්දුරට නිවැරදිව වාර්තාගත කෙරෙන අතර ආරක්ෂාසහිතව තබාගනු ඇත. කරුණාකර ඔබේ ලිපිනය හෝ ප්‍රාදේශීය වෛද්‍යවරයා වෙනස්වීම වැනි අවස්තාවක අපට දන්වන්න.



ජාන සෞඛ්‍ය සේවාව ඔබේ අයිතිවාසිකම් ආරක්ෂාකිරීමට ක්‍රියාකරනුයේ වික්ටෝරියානු මිනිස් අයිතිවාසිකම් හා වගකීම් පිළිබඳ ප්‍රඥප්තියේ මූලධර්ම අනුවය.



## ඔබේ තොරතුරු භාවිතාකිරීම සහ හෙළිකිරීම කෙරෙනුයේ කෙසේද?

මුණගැසීම වෙන්කරගැනීමෙන් පසු ජාන සෞඛ්‍ය සේවාව මුණගැසීම් පිළිබඳව ලිඛිත සාරාංශයක් ඉදිරිපත්කරනු ඇත. මෙම තොරතුරු ඔබට, ඔබේ ප්‍රාදේශීය වෛද්‍යවරයාට, යොමුකරණ වෛද්‍යවරයාට හෝ ඔබ යෝජනා කරණ වෙනත් ඕනෑම පුද්ගලයෙකුට හෝ සෞඛ්‍ය වෘත්තිකයෙකුට අප සපයනු ලැබේ. මෙය සාමාන්‍යයෙන් තැපෑලෙන්, ෆැක්ස් මගින් හෝ විද්‍යුත් මාරුවක් මගින් යවනු ලැබේ. මෙම ලිපියෙහි පිටපතක් නොලැබිය යුතු අයත් ඔබට යෝජනා කළහැකිය.

ඔබේ ප්‍රාදේශීය වෛද්‍යවරයාට හෝ යොමුකළ වෛද්‍යවරයාට අමතර තොරතුරු අවශ්‍යවේනම් අපව ඇමතිය හැකිය. ඔබ යෝජනා නොකළ පුද්ගලයෙකු විස්තර ඉල්ලා සිටියහොත්, අප ඔබගේ අවසරය ඉල්ලා සිටිනු ඇත.

ඔබේ ජාන ලිපිගොනුවට, විගණනය සඳහා තත්ත්ව සහතික කිරීමේ ව්‍යායාමයක් සඳහා ඔබේ තත්වයෙහි විශේෂ ලක්ෂණ මෙවැනිම ආබාධයක් ඇති වෙනත් අයට උදව් කිරීම සඳහා සැලසුම් කිරීමට උදව් විය හැකි අවස්ථාවක වරින් වර ජාන සෞඛ්‍ය නිලධාරීන් ප්‍රවේශ වනු ඇත.

අපේ කාර්යමංඩලය පවත්වන සියලුම පර්යෙෂණ ජාතික සෞඛ්‍ය සහ වෛද්‍ය පර්යෙෂණ කවුන්සලයේ ප්‍රතිපත්ති හා අදාළ ප්‍රමිතීන් මත රහස්‍යභාවය හා පෞද්ගලිකත්වය පිළිබඳ නීති පිළිපදින බව දැඩි ලෙස සහතිකවීමෙන්  පවත්වනු ලැබේ.

ජාන ලිපිගොනුවක් උසාවියකට ඉදිරිපත්කරන අවස්ථාවකදී, නීතියෙන් සෞඛ්‍ය තොරතුරු උසාවියකට නිදහස්කිරීමට ජාන සෞඛ්‍යයට අවශ්‍යවිය හැකිය. එවැනි දෙයක් සිදුවුවහොත් ඔබට දැනුම් දෙනු ඇත.